# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2103/8- 2018 දෙසැම්බර් මස 24 වැනි සඳුදා - 2018.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 229E කප්පල්තුරෙයි ග්‍රාම සේවා වසමේ ත්‍රිකුණාමලය නගර හා කඩවත් සර්වේ ජනරාල් විසින් 2017.10.23 දිනැතිව පිළියෙල කරන ලද FVP 21, දරන පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.9315, 0.1909 පමණ වූ කැබලි අංක 589, 590 දක්වා ඉඩමට මායිම් විස්තර පහත සඳහන් කර ඇත.

**කැබලි අංක 589 - විස්තීරණ හෙක්. 0.9315**
*උතුරට කැබලි අංක* : 590; *නැගෙනහිරට කැබලි අංක* : 590 සහ 71; *දකුණට කැබලි අංක* : 71; *බටහිරට කැබලි අංක* : 71 සහ 590.

**02. කැබලි අංක 590 - විස්තීරණ හෙක්. 0.1909**
*උතුරට කැබලි අංක* : 71; *නැගෙනහිරට කැබලි අංක* : 71; *දකුණට කැබලි අංක* : 589 සහ 71; *බටහිරට කැබලි අංක* : 71.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 පෙබරවාරි මස 11 වැනි දින පෙ. ව. 10.00 ට ප්‍රාදේශීය ලේකම් වන මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 ජනවාරි මස 28 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/පරවශතාව ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ජේ. එස්. අරුල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්,
නගර හා කඩවත් කොට්ඨාසය,
ත්‍රිකුණාමලය.

2018 දෙසැම්බර් මස 21 වැනි දින,
නගර හා කඩවත් කොට්ඨාසය,
ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-176


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*